# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/53 – 2018 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා – 2018.09.21

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/03/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2013.04.26 දිනැති හා අංක 1807/26 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.04.04 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, සිද්දමුල්ල, සුහද මාවත අංක 131 හි පදිංචි ඒ. ඒ. එස්. ජේ. පෙරේරා මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.07.09 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 28579 – 09(2018/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/15/03/2011.

**කාර්මික අධිකරණයේ දී ය.**

ඒ.ඒ.එස්.ජේ. පෙරේරා මයා,
අංක 131,
සුහද මාවත,
සිද්දමුල්ල,
පිළියන්දල.

පළමු පාර්ශවය

නඩු අංකය: ඒ - 3508

*සහ*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්,
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

වගඋත්තරකාර පාර්ශවය

යන දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධව,

**ප්‍රදානයයි**

කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013. 04. 04 වැනි දින බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දෙපාර්ශවය අතර ඇති අදාළ කාර්මික ආරාවුලට හේතු වූ කරුණ වනුයේ පහත සඳහන් කරුණ වේ:

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි සේවයේ නියුතු ඒ. ඒ. එස්. ජේ. පෙරේරා මහතාට ඒ-5 ශ්‍රේණියට උසස්වීම ලබා නොදීම නිසා ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත්ද? එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට කුමන සහනයන් කවරේද? " යන්න වේ.

උක්ත කරුණ සම්බන්ධයෙන් සමථයකින් අදාළ ගැටළුව විසඳීමට මවිසින් කරන ලද යෝජනාව කෙරෙහි වගඋත්තරකාර පාර්ශවය වැඩි උනන්දුවක් නොදක්වන බැව් පෙනී ගියෙන් විභාගය ආරම්භ කරන්නට පළමු පාර්ශවයට යෝජනා කළෙමි.

**01. පෙනී සිටීම,**

ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත ශ්‍රේෂන් ද සිල්වා මහතා පෙනී සිටි අතර දෙවන පාර්ශවය වූ වගඋත්තරකරුවන් වෙනුවෙන් රජයේ නීතිඥ රසික මල්ලවආරච්චි මහතා සමඟ වගඋත්තරකාර පාර්ශවයේ නීති නිළධාරිනි අනුරාධා ජයවර්ධන මහත්මිය හා නීති ලිපිකරු සරත් කරුණාරත්න මහතා ද පෙනී සිටියහ.

**02. ඉල්ලුම්කරුගේ ස්ථාවරය,**

ඒ. ඒ. එස්. ජේ. පෙරේරා මහතා තම නඩුව ඉදිරිපත් කරමින් පහත කරුණු සාක්ෂාත් කළේය:

I. තමා වගඋත්තරකාර ආයතනයේ 1982.07.01 දින බී (III) ශ්‍රේණියේ සහකාර පිරිපහදු කාර්මික ශිල්පියෙකු ලෙස සේවයට බැඳුනු බව,

II. වර්ෂ 2005 දී තමා මානව සම්පත් කාර්යාංශයේ සේවයට බැදුනු බව,

III. ඒ 5 නිලධාරිණිය විශ්‍රාම ගිය පසු තමා,
- *(අ)* ආයතයේ සියලු ණය කටයුතු,
- *(ආ)* ආයතනයේ නිවාඩු නිකේතන පාලනය
- *(ඇ)* ආයතනයේ ප්‍රධාන ලේඛනාගාරය භාරව ක්‍රියා කිරීම
- *(ඈ)* තැපැල් කාර්යාලයේ අධීක්ෂණ කටයුතු
- *(ඉ)* ඇතැම් විට විනය කටුයුතු අධීක්ෂණය

(ඊ) වෘත්තීය සමිති සම්බන්ධීකරණ කටයුතු
(උ) විශේෂ ව්‍යාපෘති කටයුතු බාරව ක්‍රියා කිරීම
(ඌ) මානව සම්පත් කාර්යාංශයේ පරිපාලන කටයුතු භාරව ක්‍රියා කිරීම
(එ) සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සම්බන්ධ බලයලත් නලධාරියෙකු ලෙස ක්‍රියා කිරීම ආදී කටයුතු භාරව ක්‍රියා කළ බව.

IV. ඉහත රාජකාරී ආවරණය සඳහා ලිඛිතව උපදෙස් ලත් බව.

V. මානව සම්පත් කළමනාකරුගේ අංක H.R.F. 103, 5662 හා 2010/02/25 දිනැති ලිපියෙන් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරුගේ ලිපිය ඒ. අයි. සේරසිංහ මහත්මියගේ විශ්‍රාම ගැන්වීමෙන් පසු රාජකාරී භාර දීම මැයෙන් යුත් ලිපිය A01 ලෙස සලකුණු කරමින් සේවය භාරගත් බව,

VI. මානව සම්පත් කළමනාකරුගේ 2009.10.21 දින H.R.F. 143 නම් ලිපිය මානව සම්පත් අංශයේ අභ්‍යන්තරික නිවේදනය මඟින් පිළිගත් බව.

VII. සහකාර මානව සම්පත් කළමනාකාර තනතුරට අයදුම් කිරීමට තමාට සුදුසුකම් පවත්නා බව.

VIII. ඒ සඳහා තමා අයදුම් කළ බව (උදා:- ඒ 03 ලේඛනය)

IX. තමා සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවූ බව

X. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අමාත්‍යංශ ලේකම්තුමිය, සංස්ථා සභාපති, වැඩ බලන ආයතනයේ කළමනාකරු ආදී හු සිටි බව හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ චෝදනා ලත් නිලධාරියකු ද සිටි බව.

XI. සම්මුඛ පරීක්ෂණයෙන් වෙනත් නිලධාරිණියක තෝරාගත් බව
XII. තමා ඒ සම්බන්ධව වගඋත්තරකාර ආයතනයට, කම්කරු අමාත්‍යංශයට පැමිණිලි කල බව

XIII. කාරමික අධිකරණයට පැමිණිලි කල බව

XIV. තෝරාගත් අයදුම්කාරිය ආයතනයේ විනය කඩ කළ අයෙකු බව, ණය මුදල් ගෙවීම පැහැර ඇති නිලධාරිණියක් තෝරාගත් බව

XV. සම්මුඛ පරීක්ෂණයේදී තමාට ලකුණු 45 ද තොරාගත් අයදුම්කාරියහට ලකුණු 47 වශයෙන් ලැබී තිබූ බව, එහෙත් කාර්යය ක්ෂේත්‍රයට හා පුහුණුවීම් ක්‍රීඩා හා බාහිර දක්ෂතාවයනට තමාට ලකුණු 04 ද, කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා ලකුණු 8 ද ලබා දුන්නද, වසර 27 සේවය කර ඇති තමාට ලකුණු 13.5 ලබාගත් බව මුළු ලකුණු ගණනය කිරීමේදී තමාට ලකුණු 45 හා තෝරාගත් අයදුම්කාරියට ලකුණු 47 ද වශයෙන් ලබා දී ඇයව තොරාගත් බව

XVI. නිවාස ණය කමිටුව පත්කොට එහි කමිටු ලේකම් ලෙසද, A 05 සහකාර මානව සම්පත් කළමනාකරු ලෙසද, ලේඛනාගාරයේ කටයුතු අධීක්ෂක ලෙස ද, අර්ථසාධක අරමුදල් ලබා ගැනීමේ ලිපිවලට අත්සන් කිරීමේ බලය ලැබීම, NIBM ආයතනයේ මානව සම්පත් කළමනාකරණ පාඨමාලාව හදාරා තිබීම ආදී කරුණු ඉල්ලුම්කරු සපුරා තිබීම ආදී කරුණු සිය නඩුවේදී ඉදිරිපත් කොට සාක්ෂි ලබා දුන් අතර හෙතෙම හරස් ප්‍රශ්න වැඩිදුර ප්‍රශ්න කෙරෙහිද මුහුණ දුනි.

වග උත්තරකාර පාර්ශවය වෙනුවෙන් වග උත්තරකරුගේ මානව සම්පත් කාර්යාංශ ලිපිකරු එච්. එච්. අයි.ඩී.හිඳගොඩ මහතා ද සාක්ෂි ඉදිරිපත් කළේය.

බේරුමකරණ නඩු විභාගය මෙසේ පවත්වාගෙන යන අතරතුර වර්ෂ 2014/07/28 වැනි දින වගඋත්තරකාර ආයතනයේ නීති නිලධාරිණී ඒ. ජයවර්ධන මිය මෙම ආරවුලේ විසඳීමට තිබූ " අදාළ උසස් වීම එනම් A 05 ශ්‍රේණියේ සහකාර මානව සම්පත් කළමනාකාර තනතුර පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු වන ඒ. ඒ. එස්. ජේ. පෙරේරා මහතාට වර්ෂ 2014/ 07/09 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම ප්‍රදනය කොට ඇති බැවින් " මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය නොමැති බවත්, දෙපාර්ශවයේම එකඟත්වය මත බේරුම්කරණ නඩුව සමථයට පත් වූ බවත්, ගරු අධිකරණය වෙත දන්වා සිටියෙන් දෙපාර්ශවයේම එකඟත්වය මත මෙම බේරුම්කරණ නඩුව අවසන් වන බව දන්වා සිටියහ. ඒ අනුව නඩුව අවසානයට පත් විය.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බැව් සහතික කරමි.

**එස්. කාරියවසම්,**
බේරුම්කරු

2018 ජූලි මස 09 වැනි දින දීය.

10 - 165

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.